# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2341/51 - 2023 ජූලි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2023.07.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ජාතික පොලිස් කොමිෂන් සභාව**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155එ වන ව්‍යවස්ථාවේ පරිදි ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් බලතල පැවරීම.

1. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ වන ව්‍යවස්ථාව අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවට පැවරී ඇති බලතල, ශ්‍රී ලංකා පොලිස් සේවයේ නියුතු නිලධරයන් අතුරින් පහත සඳහන් උපලේඛනයේ I වන තීරුවේ නිශ්චිතව නියම කර ඇති නිලධරයන් වෙත, II වන තීරුවේ සඳහන් නිලධරයන් සම්බන්ධයෙන්, III වන තීරුවේ සඳහන් බලතල, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් මෙමගින් පවරා දෙනු ලැබේ.

එසේ වුවද, ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සිදුකරන ලද යම් බලතල පැවරීමක් සම්බන්ධයෙන් හෝ එකී කොමිෂන් සභාව විසින් එලෙස සිදුකරන ලද යම් බලතල පැවරීමක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ කිසියම් ප්‍රශ්ණයක් උද්ගත වන අවස්ථාවකදී ජාතික පොලිස් කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුත්තේය.

තවද එසේවුවද, I වන තීරුවේ නිශ්චිතවම නියම කරනු ලැබ ඇති පොලිස් නිලධරයන්, II වන තීරුවේ නිශ්චිතව නියම කරනු ලැබ ඇති පොලිස් නිලධරයෙකුට එරෙහිව යම් විනය පරීක්ෂණයකදී, පැමිණිලිකරුවකු හෝ සාක්ෂිකරුවකු හෝ විභව්‍ය සාක්ෂිකරුවකු හෝ වන්නේනම්, මෙහි උපලේඛනයේ III වන තීරුවෙහි නිශ්චිතව නියම කරනු ලැබ ඇති පත්කිරීමේ, උසස් කිරීමේ, ස්ථානමාරු කිරීමේ, විනය පාලනය කිරීමේ හා සේවයෙන් පහ කිරීමේ බලය, ඒ සම්බන්ධයෙන් අදාල නිලධරයාට බලතල පැවරීමක් සිදුකර නොමැති සේ සළකා කටයුතු කළයුතු වන්නේය.

2. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පොලිස්පතිවරයාට සහ අනෙකුත් පොලිස් නිලධාරීන් වෙත මෙයින් පවරනු ලබන බලතල ක්‍රියාත්මක කිරීමේදී පොලිස්පතිවරයා සහ අනෙකුත් පොලිස් නිලධාරීන් විසින් සෑම අවස්ථාවකදීම ගනු ලබන තීරණ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ. වන ව්‍යවස්ථාව පරිදි ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පොලිස් නිලධාරීන්ගේ පත්කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහ කිරීම සම්බන්ධයෙන් පනවනු ලබන පටිපාටිමය රීතිවලට මෙන්ම එකී කොමිසම, කාලයෙන් කාලයට තීරණය කරන රීති, රෙගුලාසි සහ අනෙකුත් විධිවිධානවලට යටත්ව ක්‍රියාත්මක කරනු ලැබිය යුතු බවට ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් මෙයින් නිශ්චිතවම නියම කරනු ලැබේ.

එසේ වුවද, (ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ. වන ව්‍යවස්ථාව ප්‍රකාරව) පොලිස් සේවයට අදාලව එකී කාර්ය පටිපාටික රීති මඟින් විධිවිධාන සලසා නොමැති කරුණු සම්බන්ධයෙන් වූ යම් රීති, නියෝග හෝ කාර්ය පටිපාටි ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පනවනු ලබනතුරු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 21 වන සංශෝධනය ක්‍රියාත්මක වීමේ දිනට බලාත්මකව පැවතියා වූ පොලිස් සේවය හා සම්බන්ධ අනෙකුත් සියලු රීති, නියෝග හා කාර්ය පටිපාටි, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, එකී කොමිෂන් සභාව විසින් පනවනු ලැබ හෝ විධිවිධාන සලසනු ලැබ ඇති රීති, නියෝග හා කාර්ය පටිපාටි ලෙස සළකා නොකඩවා බලාත්මක විය යුතු අතර ඒවා පොලිස් සේවය සම්බන්ධයෙන් අදාල විය යුතුය.

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155උ. වන ව්‍යවස්ථාව ප්‍රකාරව ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පවරනු ලැබ ඇති බලතල මෙහි උපලේඛනයේ නිශ්චිතව සඳහන් කර නැති පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් සෘජුවම ක්‍රියාත්මක කරනු ලබනවා ඇත.

4. අංක 2202/24 සහ 2020.11.20 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනය* හා අංක 2216/12 සහ 2021.02.23 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනය* මඟින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකර ඇති බලතල පැවරීම යටතේ දැනටමත් ගෙන ඇති යම් ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි, ඉහත සඳහන් *අති විශෙෂ ගැසට් නිවේදන* සහ බලතල පැවරීම සම්බන්ධව මෙතෙක් නිකුත් කර ඇති වෙනත් යම් *අති විශෙෂ ගැසට් නිවේදන* මඟින් පොලිස් නිලධරයන් සම්බන්ධව සිදුකර ඇති බලතල පැවරීම, මෙමගින් ප්‍රත්‍යාදිෂ්ඨ වන බවටත් ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් මෙයින් නිශ්චිතව නියම කරනු ලැබේ.

5. මෙම බලතල පැවරීම 2023.07.24 දින සිට ක්‍රියාත්මක විය යුතු බවට මෙයින් නියම කරනු ලැබේ.

6. මෙම ගැසට් පත්‍රයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

ජාතික පොලිස් කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඊ.ඩබ්ලිව්.එම්. ලලිත් ඒකනායක,
සභාපති,
ජාතික පොලිස් කොමිෂන් සභාව.

2023 ජූලි මස 20 වැනි දින,
කොළඹ 07,
බෞද්ධාලෝක මාවත,
බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රය,
9 වන ගොඩනැඟිල්ල,
ජාතික පොලිස් කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

උපලේඛනය

| *I වන තීරුව* | *II වන තීරුව* | *III වන තීරුව* |
|---|---|---|
| *බලතල පවරන ලද නිලධරයන්* | *පොලිස් නිලධරයන් කාණ්ඩ* | *පවරන ලද බලතල* |
| 1. පොලිස්පතිවරයා | (අ) ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලයට පහළ නිලයන් දරන පොලිස් නිලධරයන් ;<br><br>(ආ) පොලිස් ආරක්ෂක සහායක නිලධරයන්. | (අ) ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටීන්ට හෝ සේවා ව්‍යවස්ථාවන්ට අනුකූලව පොලිස් නිලධරයන් පත්කිරීම, ස්ථානමාරු කිරීම ; (පොලිස් ස්ථාන භාර නිලධරයන් සහ ක්‍රියාකාරී කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර)<br><br>(ආ) ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ බඳවා ගැනීමේ පටිපාටීන්ට හෝ සේවා ව්‍යවස්ථාවන්ට අනුකූලව උසස් කිරීම ; (විශේෂ උසස් කිරීම් හැර)<br><br>(ඇ) පරිවාස කාලය තුළදී පත්වීම අවලංගු කිරීම හෝ සේවය අවසන් කිරීම ;<br><br>(ඈ) පරිවාස කාලසීමාවෙන් හෝ වැඩ බැලීමේ කාල සීමාවෙන් පසු සේවය ස්ථිරකිරීම හෝ පරිවාස කාලසීමාව හෝ වැඩ බැලීමේ කාලසීමාව දීර්ඝ කිරීම ;<br><br>(ඉ) වැඩ තහනම් කිරීම සහ සේවයෙන් පහ කිරීම ඇතුළු විනය පාලනය ; (පොලිස් ස්ථාන භාර නිලධරයන් සහ ක්‍රියාකාරී කෝට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර)<br><br>(ඊ) සේවයෙන් ඉල්ලා අස්වීමේ ලිපි පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම ;<br><br>(උ) සේවය අතහැර යාම සම්බන්ධයෙන් කරනු ලබන නියෝග වලට එරෙහිව සිදු කරන ලද අභියාචනා සලකා බැලීම. |
| 2. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන) | (අ) ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලයට පහළ නිලයන් දරන පොලිස් නිලධරයන් ; (පොලිස් ස්ථාන භාර නිලධරයන් සහ ක්‍රියාකාරී කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර)<br><br>(ආ) පොලිස් ආරක්ෂක සහායක නිලධරයන්. | (අ) පරිවාස කාලසීමාවෙන් හෝ වැඩ බැලීමේ කාලසීමාවෙන් පසු පත්වීම/ සේවය ස්ථිර කිරීම හෝ පරිවාස හෝ වැඩ බැලීමේ කාල සීමාව දීර්ඝ කිරීම ;<br><br>(ආ) පරිවාස කාලය තුළදී පත්වීම අවලංගු කිරීම හෝ සේවය අවසන් කිරීම ;<br><br>(ඇ) කාර්යක්ෂමතා කඩඉම් අවශ්‍යතා සම්පූර්ණ කිරීම පිණිස පරිවාස කාලසීමාව උපරිම වසර තුනක් දක්වා දීර්ඝ කිරීම ;<br><br>(ඈ) සේවයෙන් ඉල්ලා අස්වීමේ ලිපි පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම. |

| *I වන තීරුව* | *II වන තීරුව* | *III වන තීරුව* |
|---|---|---|
| *බලතල පවරන ලද නිලධරයන්* | *පොලිස් නිලධරයන් කාණ්ඩ* | *පවරන ලද බලතල* |
| 3. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති (පරිපාලන) ඇතුළුව ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන් | (අ) ප්‍රධාන පොලිස් පරීක්ෂක සහ ප්‍රධාන පොලිස් පරීක්ෂක නිලයට පහළ නිලයන් දරන පොලිස් නිලධරයන් ; (පොලිස් ස්ථාන භාර නිලධරයන් සහ ක්‍රියාකාරී කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර)<br><br>(ආ) පොලිස් ආරක්ෂක සහායක නිලධරයන්. | (අ) ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ කාර්ය පටිපාටි ප්‍රකාරව තම පරිපාලන බලප්‍රදේශය තුළ ස්ථානමාරු කිරීම ;<br><br>(ආ) තම පරිපාලන බලප්‍රදේශය තුළ අවස්ථාවෝචිත පරිදි, වැඩ බැලීමේ කාල සීමාවෙන් පසු සේවය ස්ථිර කිරීම ;<br><br>(ඇ) තම පරිපාලන බලප්‍රදේශය තුළ යම් නිලධාරියකු ඊළඟ නිලයට, ශ්‍රේණියට හෝ තනතුරට උසස් කිරීමේදී අවශ්‍ය වන්නා වූ අනිවාර්ය වැඩ බැලීමේ කාලසීමාව, එක්වරකට වර්ෂය බැගින් වූ උපරිම වශයෙන් වසර තුනක් දක්වා දීර්ඝ කිරීම ;<br><br>(ඈ) තම පරිපාලන බලප්‍රදේශය තුළ සේවය අතහැර යාම සම්බන්ධයෙන් කරනු ලබන නියෝගවලට එරෙහිව කරන ලද අභියාචනා සළකා බැලීම ;<br><br>(ඉ) තම පරිපාලන බලප්‍රදේශය තුළ වැඩ තහනම් කිරීම ඇතුළු විනය පාලනය. (සේවයෙන් පහකිරීම හැර) |
| 4. නියෝජ්‍ය පොලිස්පතිවරුන් | (අ) පොලිස් පරීක්ෂක සහ පොලිස් පරීක්ෂක නිලයට පහළ නිලයන් දරන පොලිස් නිලධරයන් ; (පොලිස් ස්ථාන භාර නිලධරයන් සහ ක්‍රියාකාරී කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර)<br><br>(ආ) පොලිස් ආරක්ෂක සහායක නිලධරයන් . | (අ) ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද කාර්ය පටිපාටි ප්‍රකාරව තම පරිපාලන බලප්‍රදේශය තුළ ස්ථාන මාරු කිරීම ;<br><br>(ආ) තම පරිපාලන බලප්‍රදේශය තුළ වැඩ තහනම් කිරීම සහ විනය පාලන කටයුතු. (සේවයෙන් පහ කිරීම හැර) |
| 5. නියෝජ්‍ය පොලිස්පතිවරුන් | (අ) මහ සැරයන් සහ මහ සැරයන් නිලයට පහළ නිලයන් දරන පොලිස් නිලධරයන් ;<br><br>(ආ) පොලිස් ආරක්ෂක සහායක නිලධරයන්. | (අ) සේවය අතහැර යාම සම්බන්ධයෙන් කරනු ලබන නියෝගවලට එරෙහිව සිදුකරන අභියාචනා සලකා බැලීම. |
| 6. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරුන්/ පොලිස් අධිකාරිවරුන් (ප්‍රාදේශීය කොට්ඨාසභාර නිලධරයන්/ ක්‍රියාකාරී කොට්ඨාස භාර අධ්‍යක්ෂවරු) | (අ) පොලිස් පරීක්ෂක සහ පොලිස් පරීක්ෂක නිලයට පහළ නිලයන් දරන පොලිස් නිලධරයන් ; (පොලිස් ස්ථාන භාර නිලධරයන් සහ ක්‍රියාකාරී කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර)<br><br>(ආ) පොලිස් ආරක්ෂක සහායක නිලධරයන්. | (අ) ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද කාර්ය පාටිපාටීන් ප්‍රකාරව තම පරිපාලන බලප්‍රදේශය තුළ ස්ථාන මාරු කිරීම ;<br><br>(ආ) තම පරිපාලන බලප්‍රදේශය තුළ වැඩ තහනම් කිරීම ;<br><br>(ඇ) තම පරිපාලන බලප්‍රදේශය තුළ විනය ශාලා දඬුවම් නියම කිරීම. |

| *I වන තීරුව* | *II වන තීරුව* | *III වන තීරුව* |
|---|---|---|
| *බලතල පවරන ලද නිලධරයන්* | *පොලිස් නිලධරයන් කාණ්ඩ* | *පවරන ලද බලතල* |
| 7. ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී/ පොලිස් අධිකාරී | (අ) පොලිස් පරීක්ෂක සහ පොලිස් පරීක්ෂක නිලයට පහළ නිලයන් දරන පොලිස් නිලධරයන් ; (පොලිස් ස්ථාන භාර නිලධරයන් සහ ක්‍රියාකාරී කොට්ඨාසවල ස්ථානාධිපතිවරුන් හැර)<br><br>(ආ) පොලිස් ආරක්ෂක සහායක නිලධරයන්. | (අ) තම පරිපාලන බලප්‍රදේශය තුළ වැඩ තහනම් කිරීම<br><br>(ආ) තම පරිපාලන බලප්‍රදේශය තුළ විනය ශාලා දඬුවම් නියම කිරීම. |
| 8. සහකාර පොලිස් අධිකාරී | (අ) මහ සැරයන් සහ මහ සැරයන් නිලයට පහළ නිලයන් දරන පොලිස් නිලධරයන් ;<br><br>(ආ) පොලිස් ආරක්ෂක සහායක නිලධරයන්. | (අ) තම පරිපාලන බල ප්‍රදේශය තුළ විනය ශාලා දඬුවම් නියම කිරීම. |

EOG 07 -0194

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.